**අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක්විය හැකි පවුල් / පුද්ගලයින් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහනදායි මිලකට ලබාදීම සඳහා නිකුත් කරන ලද 2020/03/30 දිනැති චක්‍රලේඛය සහ 2020/04/08 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා.**

# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/CSA/චක්‍රලේඛ/19/2020

2020 මාර්තු 30 දින

ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>අඩු ආදායම්ලාභී සහ අවධානමට ලක් විය හැකි පවුල් / පුද්ගලයන් සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහනදායී මිලකට ලබා දීම.</u>**

නව කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ ප්‍රමුඛතා වැඩසටහනේ එක් අත්‍යාවශ්‍ය කාර්යයක්ව පවතින්නේ සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමය. මේ සඳහා අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම් කිරීම සඳහා පත්කළ ජනාධිපති කාර්යය සාධක බලකා ක්‍රියාදාමය තුළින් හඳුනා ගත් එක් අත්‍යාවශ්‍ය කාර්යයක් වන්නේ නව කොරෝනා වෛරසය නිසා අවතැන් වූ එදිනෙදා ආර්ථික ක්‍රියාවලියට වක්‍ර ලෙස සම්බන්ධ වූ ජන කොටස්වල ජන ජීවිතය ප්‍රධාන ව්‍යූහයට සම්බන්ධ කර ගැනීමය. මෙම ජන කොටස් රජයේ සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ ආධාර ලැබිය යුතුයැයි හඳුනාගත් එහෙත් මෙතෙක් සහනාධාර නොලැබෙන පොරොත්තු ලේඛන ගත වූ ජන කොටස් ද වේ. මෙසේ පොරොත්තු ලේඛන ගතවී සිටින සංඛ්‍යාව දළ වශයෙන් 791,763ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

ඒ අනුව, සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් ද ඇතුලත්ව එකවර ගෙවන දීමනාවක් වශයෙන් රු. 5000/-ක දීමනාවක් ගෙවීම තුළින් ඔවුන් දැනට මුහුණපාන ලබන ආර්ථික දුෂ්කරතාවයන් මගහැරීමට පිටුවහලක් වේ යැයි අතිගරු ජනාධිපතිතුමා එම කාර්ය සාධක බලකායට උපදෙස් දී ඇත. එබැවින්, දැනට ගෙවනු ලබන වැඩිහිටි දීමනාව, වයස අවුරුදු 100 සම්පූර්ණ වූ වැඩිහිටියන් සඳහා වූ දීමනාව, ආබාධිත දීමනාව, සමෘද්ධි දීමනාව, වකුගඩු ආධාර දීමනාව යන දීමනා සඳහා සුදුසුකම් ලබා පොරොත්තු ලේඛනගත වී ඇති අයවලුන්ට ද එකවර ගෙවන දීමනාවක් වශයෙන් රු5000/-ක් ගෙවීමට ද උපදෙස් දී ඇත.

සහල්, පොල්, කුකුල් මස්, මාළු, බිත්තර, මුංඇට, කිරිඟු පිටි, එළවළු, ළූණු, පලතුරු, ලූණු සහ කුළුබඩු ආදී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහන මිලට පුද්ගලයින්ගේ නිවෙස් වෙත ලබා දීමට

ගාලු මුවදොර, කොළඹ 01
Galle Face, Colombo 01
දුරකථන Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් Fax ++ 94 11 2446657
prsec@presidentsoffice.lk

අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස සියලුම දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලෙස ද අතිගරු ජනාධිපතිතුමා විසින් මා වෙත නියෝග කර ඇත.

තව ද, සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස ස්ථාපනය කළ ජනාධිපති කාර්ය සාධන බලකායේ උපදෙස් මත දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හඳුනාගෙන ප්‍රතිලාභීන්ට සහන ලබාදීමට කටයුතු කරනු ලැබේ.

එබැවින්, එම සහන ලබා දීම සඳහා වන සුදුසුකම්ලාභීන් පහත පරිදි වේ.

1. වැඩිහිටි දීමනාව ලබන 416,764ක් වැඩිහිටි අයවලුන් හා වැඩිහිටි අයවලුන් වශයෙන් දැනටමත් හඳුනාගෙන පොරොත්තු ලේඛනගතව සිටින 142,345ක් සඳහා රුපියල් 5000/-ක් ගෙවීම.

2. ආබාධිත දීමනාව ලබන 72,000ක් ආබාධිත අයවලුන් හා ආබාධිත අයවලුන් වශයෙන් දැනටමත් හඳුනාගෙන පොරොත්තු ලේඛනගතව සිටින 38,791ක් සඳහා රුපියල් 5000/-ක් ගෙවීම.

3. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති ගොවීන් 160,675ක් සඳහා රුපියල් 5000/-ක් ගෙවීම.

4. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති ධීවරයන් 4,600ක් සඳහා රුපියල් 5000/-ක් ගෙවීම.

5. වකුගඩු රෝගීන් වශයෙන් දීමනාව ලබන 25,320ක් හා තවදුරටත් පොරොත්තු ලේඛනයේ සිටින 13,850 ක් සඳහා රුපියල් 5000/- ක් ගෙවීම.

6. ගර්භණී මවුවරුන් හා මන්දපෝෂණයෙන් පෙලෙන දරුවන් සඳහා ත්‍රිපෝෂ හා වෙනත් පෝෂණ ද්‍රව්‍ය, රාජ්‍ය සේවකයන් මගින් සෘජුවම නිවෙස් වෙත ලබා දීම.

7. සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි හිමිකම් ලාභියෙකු වශයෙන් දැනටමත් ප්‍රතිලාභ ලබන 1,798,655ක් හා පොරොත්තු ලේඛන ගත කර ඇති පවුල් 600,339ක් සඳහා රුපියල් 5000/-ක මුදලක් සමෘද්ධි බැංකුව/සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගෙවීම.

8. විශ්‍රාමික රජයේ සේවකයන් 645,179ක් සඳහා විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය පහසුකම් සකස් කර තිබීම.

9. රාජ්‍ය සේවයේ 1,500,000ක් වන සේවක සංඛ්‍යාව සඳහා 2020 අප්‍රේල් මස වැටුප ගෙවීමට දැනටමත් අවශ්‍ය කටයුතු කර ඇති අතර වැටුප මත අය කරන ණය මුදල් අය කිරීම නැවත දන්වන තුරු අත්හිටුවීම.

10. රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩපිළිවෙල යටතේ උපාධිධාරීන් 40,000 ක් පමණ රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා ඔවුන් වෙත මසකට රු.20,000/-ක දීමනාවක් ලබාදීමෙන් එම පවුල්වල ආර්ථික ශක්තිය ඉහළ නැංවීම.

11. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක PTF/02/01/02 දරණ 2020.03.30 දිනැති චක්‍රලේඛය පරිදි, බඳවාගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ඔවුන් පදිංචි බල ප්‍රදේශවල පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, පොලිස් ස්ථාන, සමෘද්ධි බැංකු සහ ග්‍රාම නිලධාරී කාර්යාල වැනි ආයතන වෙත උපරිම සෞඛ්‍ය කොන්දෙසිවලට යටත්ව, සේවයේ අවශ්‍යතාවය මත අනුයුක්ත කරමින් සෞඛ්‍ය නිවාරණ කටයුතු සහ සිවිල් රාජකාරි කටයුතු සඳහා යොදාවා ගැනීම

12. පවතින විශේෂිත තත්ත්වය යටතේ මුහුණ දී ඇති ආර්ථික අපහසුතාවයන් මත සේවකයන් වෙත වැටුප් ගෙවාගත නොහැකිව පවතින පෞද්ගලික ව්‍යාපාරයන් සඳහා සහන ලබා දීමට රජය විසින් කටයුතු කිරීම.

13. ත්‍රිරෝද රථ, ට්‍රක් රථ, පාසල් බස් රථ හා වෑන් රථ, ස්වයං රැකියා සඳහා යොදා ගන්නා මෝටර් රථ ආදී ස්වයං රැකියාලාභීන් 1,500,000ක් සඳහා කල්බදු වාරික සඳහා සහන සලසා දීම.

14. ත්‍රිරෝද රථ, මෝටර් බයිසිකල්, පාසල් වෑන් රථ වැනි ස්වයං රැකියාවල නිරතවන්නන් උපරිම වශයෙන් තම බල ප්‍රදේශ තුළ භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියට යොදවාගැනීම මගින් ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සලසා ගැනීමට අත දීම.

15. මුඛ ආවරණ, සෞඛ්‍යාරක්ෂිත ඇඳුම්, අත්වැසුම්, ශ්වසන ආධාරක උපකරණ, රෝහල් ඇඳන් වැනි සෞඛ්‍ය ආධාරක උපකරණ මෙන්ම අපනයන වෙළඳපල අරමුණු කරගත් තේ, කුරුඳු, ගම්මිරිස් වැනි භෝග සහ බිත්තර, මස් හා මාළු වැනි පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදකයින්ට තම බල ප්‍රදේශවල ක්‍රියාත්මක වීමට අවශ්‍ය කටයුතු සැලසීම.

ඉහත වර්ගීකරණයන්ට අදාල නොවන නමුත් අවධානමට ලක්විය හැකි ලෙස හඳුනාගන්නා පුද්ගලයින් වෙත පහසුකම් ලබා දීම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සමාජ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතුය.

ජනතාව වෙත මෙම පහසුකම් ලබා දීම, සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා මෙහෙයවිය යුතු අතර එක් පුද්ගලයෙකු / පවුලක් වෙත මෙම මූල්‍ය ප්‍රතිලාභ මාසික දීමනාවක් ලෙස ලබා දීමට වගබලාගත යුතුය.

දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය පුද්ගලයන් වෙත සෘජුවම බෙදා දීමට කටයුතු කළයුතු අතර වෙනත් සැපයුම්කරුවන් මගින් සපයා දීමට

කටයුතු කිරීමේදී පාරිභෝගිකයින්ට දරාගත හැකි ගොවි හා අනෙකුත් නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ඇතිවන පරිදි අතරමැදියන්ගෙන් තොරව සම්බන්ධ කිරීමටත් සතොස, සමූපකාර වෙළඳ ජාලය හා පෞද්ගලික වෙළඳ ජාලයන් මෙහෙයවීමටත් ප්‍රවාහන කටයුතු හා බෙදා හැරීම් කටයුතු කිරීමටත්, ජනාධිපති කාර්ය සාධන බලකායේ උපදෙස් හා මගපෙන්වීම යටතේ මෙම කාර්යයන් ඉටු කිරීමටත් වගබලාගත යුතුය.

සෞඛ්‍ය බලධාරීන් දී ඇති කොන්දේසිවලට හා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති උපදෙස්වලට අනුකූලව මෙම කටයුතු මෙහෙයවීමට දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබාදෙන ලෙස ජනාධිපතිතුමා නියෝග දී ඇති බවද නැවත අවධාරණය කරමි.

මෙම සහන ලබා දීම නව කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ ප්‍රමුඛතා වැඩසටහන අවසාන වූ බවට ප්‍රකාශයට පත් කරන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පී.බී.ජයසුන්දර
ජනාධිපති ලේකම්

**පිටපත්:**

1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - අ.ක.ස.
2. ලේකම්, අභ්‍යන්තර, වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය - අ.ක.ස.
3. සභාපති, මැතිවරණ කොමිෂන් සභාව - දැ.ගැ.ස.
4. විගණකාධිපති - දැ.ගැ.ස.
5. වැ.බ. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව - අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව - අ.ක.ස.

**කොරෝනා උවදුර හේතුවෙන් ජන ජීවිතය අඩාල වී ඇති පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවූ රු.5000/- දීමනාව ඒ හා සමාන ජීවනෝපාය අහිමි වූ අනිකුත් ජන කොටස් සඳහා ද ගෙවීම**

**2020/04/08 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා**

| අනු අංකය | දීමනා | මුදල |
|---|---|---|
| 01 | වැඩිහිටි දීමනාව | රු.5000/-<br><br>i. වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන්ට දැනට ගෙවනු ලබන මාසික රු.2000/- දීමනාව වෙනුවට එක් වරක් පමණක් ගෙවනු ලබන අතිරේක රු.3000/- ක් ලෙසින් රු.5000/-ක් ගෙවීම<br><br>ii. පොරොත්තු ලේඛනලාභීන් සඳහා රු.5000/- ගෙවීම<br><br>iii. දැනට වැඩිහිටි දීමනාව රු.2000/- ගෙවා ඇති අයට තවත් අමතර රු.3000/- ගෙවීම<br><br>iv. සියවස්පූර්ණ දීමනාව රු.5000/- ගෙවීම |
| 02 | ආබාධිත දීමනාව | රු.5000/-<br><br>i. දැනට ආබාධිත දීමනාව ලබන ප්‍රතිලාභීන් සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම<br><br>ii. පොරොත්තු ලේඛන ගත ආබාධිතයින් සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම |
| 03 | වකුගඩු රෝගීන් සඳහා වන දීමනාව | රු.5000/-<br><br>i. දැනට වකුගඩු දීමනාව ලබන ප්‍රතිලාභීන් සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම<br><br>ii. පොරොත්තු ලේඛනගත වකුගඩු රෝගීන් සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම |
| 04 | සමෘද්ධි දීමනාව | පොරොත්තු ලේඛනගත අය සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම |
| 05 | ගොවි විශ්‍රාම වැටුප | දැනට ගෙවනු ලබන ගොවි විශ්‍රාම වැටුප රු.5000/- වන තෙක් වැඩි කර දීමනාව ගෙවීම |
| 06 | ධීවර විශ්‍රාම වැටුප | දැනට ගෙවනු ලබන ධීවර විශ්‍රාම වැටුප රු.5000/- තෙක් වැඩි කොට දීමනාව ගෙවීම |
| 07 | ඍජුව හෝ වක්‍රාකාරව ජීවනෝපාය අහිමි වන අසරණ ජන කොට්ඨාසයන්ට | රු.5000/- දීමනාව ගෙවීම |

නිරෝධායන කටයුතුවල ප්‍රගතිය අනුව දීමනා ක්‍රියාත්මක කිරීමේ උපදේශයන් වරින් වර නිකුත් කරනු ලැබේ.